# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1906/46 - 2015 මාර්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2015.03.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මොණරාගල මඩුල්ල ජලසම්පාදන ක්‍රමයේ ගබඩා ටැංකියක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටස අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2015 මාර්තු මස 10 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1041.

**උපලේඛනය**

මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇල්ලෙකොණ ග්‍රාම නිලධාරී වසමේ දඹගල්ල ගල්බොඩගම ගමේ පිහිටි අ. ග. පි. 594 පිඹුරේ කැබලි අංක 980 දරන ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 40ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා අ. ග. පි. 594 පිඹුරේ කැබලි අංක 986 ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | ගල්ගොඩගම සිට ගෝනතලාවට යන මාර්ගය ; |
| *බටහිරට* | : | අ. ග. පි. 594 පිඹුරේ කැබලි අංක 986 ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ඩබ්. පී. පත්මා මිය,
එම්. ඕ. එච්. පාර, සිරිවිජය පුර,
මොණරාගල.

04 -163

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට, ඇටම්පිටිය ජල සම්පාදන ක්‍රමයේ පල්ලේගම වේල්ලේවෙල ජල පිරිපහදු ඒකකය හා ජල පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1092.

*උපලේඛනය*

බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම ග්‍රාම නිලධාරී වසමේ පල්ලේගම වේල්ලේවෙල ගමේ පිහිටි ජයභූමි ඔප්පු අංක 28264 හි සඳහන් ඉඩමෙන් අක්කර 01ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම ; |
| *නැගෙනහිරට* | : | යූ. එල්. රණසිංහ මයා හිමිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | උක්කුබණ්ඩා මහතා හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | වැලිමඩ සිට ඇටම්පිටිය දක්වා ප්‍රධාන මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. යූ. එල්. රණසිංහ මහතා,
වේල්ලේවෙල,
ඇටම්පිටිය.

04 -164

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට, යෝජිත මාතර IV වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ ජල පවිත්‍රාගාරය, ගබඩා ටැංකිය, පරිපාලන ගොඩනැගිල්ල, යන්ත්‍රාගාරය, පොම්පාගාරය හා නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 350A කටුවන්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ කටුවන්ගොඩ ගමේ පිහිටි කටුවලගේවත්ත සහ පුංචිලමාහාමිලාගේ කොරටුව නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 03, රූඩ් 2ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කුඹුරුයාය සහ එලෝකන්ද වත්ත ; |
| *නැගෙනහිරට* | : | කුඹුරුයාය සහ එලෝකන්ද වත්ත කටුවන්ගොඩ දක්වා දිවෙන පාර ; |
| *දකුණට* | : | කටුවන්ගොඩ දක්වා දිවෙන පාර සහ බේරුවලගේ වත්ත ; |
| *බටහිරට* | : | ඉහලගේවත්ත සහ කොටපොලගේවත්ත ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. එන්. බී. පලිහවඩන සහ රාමසිරි පලිහඩවන මයා,
බංගලාව,
මාලිම්බඩ පාර,
කද්දූව - තෙලිජ්ජවිල.

04 -165